# ක්‍රිස්තුස් වහන්සේ හා භාරතීය ආභාසය

සියවස් තුනක් පමණ එතරම් පැතිරීමක් නොතිබුණු ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් රෝම අධිරාජ්‍යය විසින් අවශෝෂණය කරගනු ලැබිණි. යුදෙව්වන් අතර ක්‍රිස්තුස් වහන්ස්ගේ ඉගැන්වීම් එතරම් නොපැතිරීම පුදුමයක් නො වේ. ඒ උන්වහන්සේ යුදෙව්වන්ට හා යුදෙව් චින්තනයට තර්ජනයක් වූ බැවිනි. එහෙත් රෝමයන් අතර ඒ ජනප්‍රිය වූයේ කෙසේ ද ඇයි ද ආදී ප්‍රශ්නවලට පැහැදිලි පිළිතුරු ඇතැයි නො සිතමි. කෙසේ වෙතත් රෝමයෝ ඒ ඇසුරෙන් ආගමක් ද වඩා පළල් අධිරාජ්‍යයක් ද ගොඩ නැගූහ.

රෝමයන් ගොඩනැගූ ආගම කතෝලික හෙවත් රෝමානු කතෝලික නමින් හැඳින්වෙයි. අප කලින් ද කියා ඇති පරිදි කතෝලික යන්නෙහි තේරුම සමස්තය යන්න ය. මෙය ද ක්‍රිස්තුස් වහන්සේට භාරතයෙන් ලැබුණු දැනුමක් බව පැහැදිලි ය. වෛදික ආගමෙහි බ්‍රහ්මන් යනු සමස්තය වෙයි. බ්‍රහ්මන් හා ඒතුමා මැවූ ලෝකය යනු එකක් මිස දෙකක් නො වේ. පසු කලෙක නිර්ගුණ අද්වෛත බ්‍රහ්මන් දක්වා වර්ධනය වූයේ මේ සංකල්පය .ය.

ඒ නයින් බැලූ කල කතෝලික ආගමට වෛදික ආගමෙන් අඩුම තරමින් ප්‍රධාන සංකල්ප තුනක් හිමි වී ඇත. බ්‍රහ්මන්ගේ ත්‍රිමූර්තියෙන් එකක් වූ විෂ්ණු විවිධ අවතාර ගෙන මිනිස් ලොවට එළඹෙන ආකාරයට දෙවියන් වහන්සේ තම පුත්‍රයාගේ වෙසින් ක්‍රිස්තුස් වහන්සේ ලෙස මනුෂ්‍යයකු මෙන් ඉපිද ඇත. දෙවනුව ලෝකය සමස්තයක් ය යන හැඟීම වෙයි. තුන්වැනුව ඒ ආගම් දෙකෙහිම න්‍යාය ත්‍රිකෝටික න්‍යාය වෙයි. ත්‍රිකෝටික න්‍යායෙහි යම් ප්‍රස්තුතයක් මෙන් ම එහි නිෂේධය ද  එක්විට සත්‍ය විය හැකි ය.

ක්‍රිස්තුස් වහන්සේට එක්විට දෙවියන් වහන්සේ මෙන් ම දෙවියන් වහන්සේගේ පුතා ද විය හැක්කේ ත්‍රිකෝටිකයට පින් සිද්ධවන්නට ය. ද්විකෝටිකය අනුව දෙවියන් වහන්සේ කිසිසේත් ම ක්‍රිස්තුස් වහන්සේ විය නො හැකි ය. එපමණක් නොව එක්විට ක්‍රිස්තුස් වහන්සේට දෙවියන් වහන්සේ මෙන් ම දෙවියන් වහන්සේගේ පුතා ද විය හැක්කේ ත්‍රිකෝටික න්‍යාය යොදා ගැනීමෙනි. ද්විකෝටිකයෙහි දී ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේ නම් දෙවියන් වහන්සේගේ පුත්‍රයා විය නො හැකි ය. ද්විකෝටිකයෙහි යම් ප්‍රස්තුතයක් හා එහි නිෂේධය  දෙකම එක්වර වලංගු වීමට නො හැකි ය.

ඇතැමුන් ක්‍රිස්තුස් වහන්සේ බුද්ධදහමින් ආභාසය ලබා ඇතැයි කීමට තැත්කළ ද ඒ සඳහා පිළිගත හැකි සාක්ෂි නැත. ක්‍රිස්තුස් වහන්සේ දේශනා කර ඇත්තේ ආත්මවාදී දහමකි. එහෙත් අපට මගහැරීමට නොහැකි කරුණක් වෙයි. ඒ ඇතැම් මහායානික ගුරුකුල ද වෛදික සම්ප්‍රදායේ ආභාසය ලබා ආත්මවාදී වීම සහ සමස්තය ගැන කතාකිරීම ය. එසේම බුදුන් වහන්සේගේ විවිධ කාය ගැන සංකල්ප නිර්මාණය කර ඒ ඇතැම් කායක් අනන්ත කාලයක් පවතින ලෙස ගැනීමත්  යළි ඉපදීම නැතිකරනු වෙනුවට අමරණීය තත්වයකට බුදුන් වහන්සේ පත්කිරීමත් ඒ මහායානික ගුරුකුලවල දැකිය හැකි ය.

මේ මහායානික ගුරුකුල වෛදිකයන්ගේ ආභාසය යම් යම් කරුණුවල දී  ලබාගත්ත ද විෂ්ණු අවතාර සම්ප්‍රාප්තිය ඒ අයුරින් ම ලබාගෙන නැත. එබැවින් ක්‍රිස්තුස් වහන්සේට භාරතීය ආභාසය ලැබෙන්නට ඇත්තේ වක්‍රව කිසියම් වූ බෞද්ධ ගුරුකුලයකින් නොව සෘජුව ම හෝ වක්‍ර ව හෝ වෛදිකයන්ගෙන් විය යුතු ය. ඒ කෙසේ වෙතත් ක්‍රිස්තුස් වහන්සේට එවැනි ආභාසයක් ලැබෙන්නට ඇත්තේ භාරතයෙන් බටහිර ආසියාවට ගිය වෙළෙඳුන්ගෙන් ද (බුද්ධිමතුන්ගෙන් ද), එසේත් නැත්නම් උන්වහන්සේ භාරතයට පැමිණ ඒ දැනුම ලබාගත්තේ ද යන්න කීමට තරම් අපට වර්තමානයේ දත්ත නැත. එයින් කියැවෙන්නේ ඒ පිළිබඳ දත්ත කිසිවකුටවත් නැති බවක් නො වේ. එවැනි දත්ත අපට නැති බව පමණක් ඉන් ගම්‍ය වෙයි.

රෝමානු කතෝලික ආගම හා වෛදික ආගම අතර ඇති සම්බන්ධය ක්‍රිස්තියානි හෝ කතෝලික හෝ උගතුන්ගේ අවධානයට ලක්නොවන්නේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාට වෙනත් අයකුගෙන් එවැනි දැනුමක් ලබාගත යුතු ද යන්න ප්‍රශ්නයක් වන නිසා යැයි සිතිය හැකි ය. එහෙත් බෞද්ධයනට හා වත්මන් හින්දූන්ට (ක්‍රිස්තුස් වහන්සේගේ කාලයෙහි දී හින්දූ ආගමක් නොතිබූ බව අවධාරණය කළ යුතු ය.) එවැනි අධ්‍යයනයක් කිරීමේ බාධාවක් තිබිය නො හැකි ය. එසේ

කළ යුත්තේ කිසියම් ආගමක් පහත හෙළීමේ පටු චේතනාවෙන් නොව දැනුම නිර්මාණය කිරීම හා ගලායෑම කෙසේ සිදුවන්නේ දැයි දැනගැනීම සඳහා ය.

කෙසේ වෙතත් ක්‍රිස්තුස් වහන්සේ විසින් කරන ලද චින්තන විප්ලවය අප විසින් සුළුවෙන් සැලකිය යුතු නො වේ. බටහිරයන් දැනුම් ආධිපත්‍යය ලබාගැනීමට පෙර සියවස් තුනක හතරක පමණ ග්‍රීක චින්තන මැදිහත්වීමක් හැරෙන්නට ලෝකයේ දැනුම් මධ්‍යස්ථානය වූයේ ආසියාව ය. යුදෙව් චින්තනය පවා බිහිවූයේ බටහිර ආසියාවෙහි ය. ඒ තරමක් අනෙක් ආසියාතික දැනුම්වලින් වෙනස් විය. විශේෂයෙන් ම වියුක්තය ලොවට හඳුන්වාදුන්නෝ යුදෙව්වෝ ය. ඒ කලින් කියා ඇති පරිදි බටහිර ආසියාවේ කාන්තාරවල නිර්මාණය විය. ක්‍රිස්තුස් වහන්සේ කරන ලද්දේ යුදෙව් චින්තනයෙන් වියුක්ත බව පළවා හැරීම ය. මිනිසාගෙන් හා ලෝකයෙන් වියෝ වී සිටි දෙවියන් වහන්සේ කෙනකු වෙනුවට ක්‍රිස්තුස් වහන්සේ මිනිස් ලොව සමග සම්බන්ධකම් ඇතිකරගත් සංයුක්ත දෙවියන් වහන්සේ කෙනකු හඳුන්වා දුන්හ.

එසේ කිරීමේ දී ක්‍රිස්තුස් වහන්සේ භාරතයේ දැනුමෙන් ආභාසය ලැබුවා පමණක් නොව යුදෙව් චින්තනය ද වෙනස් කර එතරම් වියුක්ත නොවූ අනෙක් ආසියාතික චින්තන සමග පෑහෙන චින්තනයක් නිර්මාණය කළහ. අප මතක තබාගත යුතු කරුණක් නම් යුදෙව් චින්තනය අනෙක් ආසියාතික චින්තනවලින් ප්‍රධාන වශයෙන් ම වෙනස් වූයේ එය වියුක්ත වීම හේතුවෙනි. වියුක්තය නැති වූ විට ඒ අනෙක් ආසියාතික චින්තන සමග පෑහෙන්නට විය. භාරතයෙන් ආභාසය ලබා ක්‍රිස්තුස් වහන්සේ ඇතිකළ චින්තනයට අපි කතෝලික චින්තනය යැයි කියමු.

අප කලින් කියා ඇති පරිදි මේ නව චින්තනය යුදෙව්වන් අතර ජනප්‍රිය නො වී ය. ඔවුන්ට දෙවියන් වහන්සේ වියුක්ත දෙවියන් වහන්සේ කෙනකු ලෙස මිනිසුන්ගෙන් ඈත්කර තැබීමට අවශ්‍ය වූවා නිසැක ය. එහෙත් මේ යුදෙව්වන් ආසියාතිකයන් වූ බවත් යුරෝපයේ මේ වන විට ග්‍රීක චින්තනය හැරෙන්නට වෙනත් වැදගත් චින්තනයක් බිහි නොවී තිබූ බවත් අමතක නොකළ යුතු ය. රෝමයන් නීති පද්ධතියක් හා මහා මාර්ග පද්ධතියක් ගොඩ නගා තිබුණ ද දාර්ශනික වශයෙන් ගත්කල චින්තනයක් නිර්මාණය කර නොතිබුණි. වහල් සමාජයක් මත පදනම් ව යුද්ධය ආධාර කරගනිමින් යටත්විජිත අත්පත් කරගත් රෝමයන්ට දර්ශනයක අවශ්‍යතාව තිබෙන්නට ඇත.

අනෙක් අතට ග්‍රීකයන්ට එවැනි අවශ්‍යතාවක් නො වී ය. ඔවුන්ට ඔවුන්ගේ ස්වසිද්ධාත්මක විධි ක්‍රමය හා ඇරිස්ටෝටලීය න්‍යාය විය. ඒ ඔස්සේ ඔවුහු එතෙක් අනෙක් රටවල පැවති දැනුම ක්‍රමානුකූල ව සංවිධානය කළහ. ස්වසිද්ධිවලින් හෙවත් ප්‍රත්‍යක්ෂවලින් පටන්ගෙන ඇරිස්ටෝටලීය න්‍යාය යොදාගනිමින් නිගමනවලට පැමිණීම ඔවුන් විසින් ලෝකයට හඳුන්වාදෙනු ලැබිණි. ග්‍රීකයන් විසින් එසේ ඇතිකරනු ලැබූ දැනුම බොහෝ විට සාධාරණීකරණයට ලක්වූ දැනුමක් විය. ඒ දැනුමේ ද එක්තරා වියුක්ත බවක් තිබිණි. ඒ ඔවුන් යුදෙව්වන්ගෙන් ලබාගත්තක් විය හැකි ය. එහෙත් යුදෙව්වන් පමණට ම ග්‍රීකයන් වියුක්ත වී යැයි කිව නො හැකි ය.

ග්‍රීක දැනුම සෘජුව ම ලෝකයට බලපෑම් කළ කාලය අවුරුදු තුන් සියයකට හාරසියයකට පමණ සීමා විය. ඒ කාලයෙහි ඔවුහු ලෝකයේ සෙසු ප්‍රදේශවල තිබූ දැනුම එක රාශිකර බොහෝ විට ස්වසිද්ධාත්මක ක්‍රමය යොදා ගනිමින් සාධාරණීකරණයට ලක් කරමින් නව දැනුමක් ගොඩ නැගූහ. එහෙත් ග්‍රීකයන්ට මේ කාර්යය දිගින් දිගට ම කරගෙන යෑමට නො හැකි විය. ඔවුහු ප්‍රධාන වශයෙන් ම දැනුම සංවිධානය කරන්නවුන් මිස බොහෝ විට සෘජුව ම දැනුම නිර්මාණය කරන්නෝ නො වූහ.

රෝමයෝ තුන්වැනි සියවසේ දී කොන්ස්ටන්ටයින් රජුගේ රාජ්‍ය සමයෙහි දී ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් මත පදනම් ව නව ආගමක් තනා ඉන්පසු එය තම අධිරාජ්‍යය පුරා ව්‍යාප්ත කළහ. ආරම්භයේ දී ආගම රජුට ප්‍රධානත්වය දුන් නමුත් කල් යෑමේ දී ආගම ම ප්‍රධානත්වයට පත්විය. පාප් වහන්සේ නමින් ඇතිකරනු ලැබූ නිලය අධිරාජ්‍යයේ ප්‍රධාන නිලය බවට පත්විය. පළමු පාප් වහන්සේ ලෙස නම් කෙරී ඇත්තේ ක්‍රිස්තුස් වහන්සේගේ ගෝලයකු වූ නමුත් එතුමාට බලතල නො තිබුණි. එවැනි නිලයක් ක්‍රිස්තුස් වහන්සේගේ මරණයෙන් පසු ඇති කෙරිණි ද යන්න ද ප්‍රශ්නයකි.

පාප් වහන්සේ යන්නෙහි තේරුම පියා යන්න ය. වෙනත් වචනවලින් කියන්නේ නම් පාප් වහන්සේ යනු දෙවියන් වහන්සේගේ මෙලොව නියෝජිතයා විය. ඒ ක්‍රිස්තුස් වහන්සේ තමන් වහන්සේ දෙවියන් වහන්සේ හා දෙවියන්

© Prof. Nalin De Silva

වහන්සේගේ පුත්‍රයා ලෙස ප්‍රකාශ කිරීමෙන් ලබාගත්තක් බව පැහැදිලි ය. ක්‍රිස්තුස් වහන්සේගේ මරණයෙන් පසු උන්වහන්සේගේ කිසිම ගෝලයකු තමන් දෙවියන් වහන්සේගේ නියෝජිතයා යැයි පැවසීමට ඇති ඉඩකඩ ඉතා අඩු ය. ක්‍රිස්තුස් වහන්සේට මරණ දඬුවම දීමට යුදෙව්වන් ක්‍රියා කෙළේ ම උන්වහන්සේ තමන් වහන්සේ දෙවියන් වහන්සේ බව ප්‍රකාශ කිරීම හේතුවෙනි. එවැනි තත්වයක් යටතේ උන්වහන්සේගේ ගෝලයකු ඒ යුදෙව් සමාජයෙහි ම තමන් දෙවියන් වහන්සේගේ නියෝජිතයා යැයි පැවසීමට ඉඩක් නැත. ක්‍රිස්තුස් වහන්සේගේ මරණයත් සමග උන්වහන්සේගේ ගෝලයන් ඉතා අසරණ බවට පත්වීම ස්වාභාවික ය. සමාජයේ බලයක් නොතිබූ පිරිසක් එවැනි අසරණ භාවයක සිටිමින් තමන්ගෙන් එක් අයකු දෙවියන් වහන්සේගේ නියෝජිතයා යැයි ප්‍රකාශ කෙළේ නම් ඔහුට ද මරණ දඬුවම නියම කරවීමට යුදෙව්වන් කටයුතු කරනු නො අනුමාන ය.

පාප් වහන්සේ යනු ජීතෘ බව සහ දෙවියන් වහන්සේගේ නියෝජිතයා ය යන්න රෝම රාජ්‍යය හා එහි ආගම බවට පත් වූ කතෝලික ආගම අතර හටගත් අරගලයක දී නිර්මාණය වූ සංකල්පයක් විය යුතු ය. රජු අභිබවා ආගම පැන නැගීම එක් රැයකින් සිදු වුවක් විය නො හැකි ය. ආගමේ නායකයා රාජ්‍යයේ නායකයා බවට පත්වීමේ කතාව අපට වැදගත් වෙයි. ඉස්ලාම් ආගමේ ද එවැන්නක් මුල සිට ම පැවතිණි. දැනුම පිළිබඳ කතාවේ දී රෝම අධිරාජ්‍යයේ නැගීම හා වැටීම අපට වැදගත්වන්නේ අවසානයේ දී බටහිර දැනුම් ආධිපත්‍යය ගොඩ නැගුණේ රෝම අධිරාජ්‍යය මුල් කරගෙන වීම නිසා ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva